ජපන් තානාපති කාර්යාලය

අංක 20, ග්‍රෙගරි පාර, කොළඹ 7
දුරකථන : +94-11-2693831~3, ෆැක්ස් : +94-11-2698629
ඊමේල් : cultujpn@co.mofa.go.jp

## පුවත්පත් නිවේදනය

නොවැම්බර් 8, 2011

# රත්නපුර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය සංවර්ධන කටයුතු සඳහා ජපන් රජයෙන් ආධාර

ජපන් රජය විසින්, බිම් මට්ටමේ මානව සුරැකීමේ ආධාර ව්‍යාපෘතිය (GGP) යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ සහ පැල්මඩුල්ල දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශයන්හි ප්‍රජාවගේ ජීවන පරිසරය සහ ජීවනෝපායන් ඉහල නැංවීමේ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා ඩොලර් 85,104 (දළ වශයෙන් රුපියල් මිලියන 9.4 ක) ආධාරයක් ප්‍රධානය කරන ලදි.

මෙම ව්‍යාපෘතිය සබරගමුව ප්‍රජා සංවර්ධන පදනම මගින් ක්‍රියාත්මක කරන අතර, ඒ තුලින් පානීය පල ව්‍යාපෘති හතරක් සහ වගා ළිං හතක් ඉදි කරනු ලැබේ. අබලන්වූ පාරක් ප්‍රතිසංස්කරණය කිරීමද මෙම ව්‍යාපෘතිය හරහා සිදුවන අතර, ප්‍රදේශයේ පවුල් 400කට සෘජුවම මෙම මුළු ව්‍යාපෘතියම හරහා ප්‍රතිලාභ ලැබෙනු ඇත.

සබරගමුව ප්‍රජා සංවර්ධන පදනමේ සභාපති, පාලිත කරුණාරත්න මහතා මෙම ව්‍යාපෘතියට ආධාර සැපයීම වෙනුවෙන් ජපන් රජයට කෘතඥ පූර්වක ස්තුතිය පිරිනැමූ අතර, මෙම ව්‍යාපෘතිය සිංහල, දෙමල, මුස්ලිම් යනාදී සියළුම ජාතීන් සහ ආගමික කණ්ඩායම් නියෝජනය වන පරිදි ක්‍රියාත්මක වන බවද පැවසීය. එමෙන්ම මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන්නේ පැල්මඩුල්ල වතුයාය, වැව්ලි මානව සංවර්ධන භාරය මෙන්ම ජපන් අන්තර් ජාතික සහයෝගිතා ආයතනයට අනුබද්ධිත ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ස්වේච්ඡා සේවය හරහා පැල්මඩුල්ල වතුයායේ පෙර පාසලේ ගුරුවරියක ලෙස සේවය කරන මිනාකෝ හයෂි මෙනවියගේ ද සහයෝගිත්වයෙන් බවද, කරුණාරත්න මහතා තවදුරටත් පැවසීය.

සංවර්ධනයේ දැවැන්ත සහකරුවකු ලෙස ජපානය, ශ්‍රී ලංකාවේ සාමාජයිය ආර්ථික සංවර්ධනය සඳහා රජය සමග මෙන්ම රටේ ජනතාව සමග ද අත්වැල් බැඳගෙන සිටී. ජපානයේ සංවර්ධනය දෙස අතිතාවර්ජනය කිරීමේදී, ග්‍රාමීය සංවර්ධනය මුළු රටේම සංවර්ධනය වෙනුවෙන් ලොකු භූමිකාවක් රඟපාන බව පැහැදිලිය. එමෙන්ම මෙම ව්‍යාපෘතියත් අදාල ප්‍රාදේශයන්හි සංවර්ධනය සඳහා මහත් පිටුවහලක් වී ජාතියේ සංවර්ධනය නගා සිටුවීමටද මූලිකත්වයක් ගනු ඇත.

ජපන් තානාපති නොබුහිතෝ හොබෝ මහතාත්, සබරගමුව ප්‍රජා සංවර්ධන පදනමේ සභාපති පාලිත කරුණාරත්න මහතාත් අතර, මෙම අධාර ප්‍රදානය කිරීමේ ගිවිසුම, 2011 නොවැම්බර් මස 8 වන දින තානාපති නිල නිවසේදී අත්සන් කරන ලදි,


වැඩි විස්තර සඳහා, කරුණාකර විමසන්න

ආර්ථික සහයෝගිතා අංශය, ජපන් තානාපති කාර්යාලයය

දුරකථන 011-2693831 දිගු අංකය 225

ඊ මේල් : cultujpn@co.mofa.go.jp